# රබර් කර්මාන්තයේ ප්‍රතිලාභ මොණරාගලටත්

ඒ. නුගවෙල

සම්ප්‍රදානුකූලව මොණරාගල කුඩා ඉඩම් හිමියන් කෙටි කාලීන භෝග වගාවට නැඹුරු වී ඇත. එළවලු වර්ග සහ උක් මීන් ප්‍රධාන තැනක් ගනී. මෙම භෝග වගාවට විශාල මිනිස් ශ්‍රමයක් සෑම වසරක් පාසාම අවශ්‍යය. මැදි වියට පසු ගොවි මහතුන්ට ඇති මෙම හැකියාව හීන වීම ඔවුන්ගේ ආදායමටත් ජීවන තත්ත්වයටත් සෘජුවම බලපායි. කෙසේ වෙතත් දීර්ඝ කාලීන බෝගයක් වැඩි මිනිස් ශ්‍රමයක් නොමැතිව නඩත්තු කර අස්වැනක් නෙලා ගත හැකි වීම ගොවි මහතුනට ඉමහත් සහනයකි. මේ සඳහා මොණරාගල දිස්ත්‍රික්කයට ඉතාමත්ම සුදුසුම වගාවක් හැටියට රබර් වගාව හඳුන්වා දිය හැක.

ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තයට වසර සියයකටත් අධික ඉතිහාසයක් ඇත. වර්තමානයේදී අප රටේ ස්වාභාවික රබර් ආශ්‍රිත කර්මාන්ත වැඩිවීම තුලින් රට තුල නිපදවන ස්වාභාවික රබර් වලට ඇති ඉල්ලුම විශාල වශයෙන් ඉහළ ගොස් ඇත. මෙසේ ස්වභාවික රබර් වලට ඉල්ලුම කොපමන වැඩිවී ඇත්දැයි කිවහොත්, නිමි භාණ්ඩ නිපදවන කර්මාන්ත වලට අවශ්‍ය ස්වාභාවික රබර් අප රට තුලින්ම සපයා දීමට බැරි තත්ත්වයක් උදාවී ඇත. ලෝක වෙළඳ පොලේ රබර් වලට ඇති ඉහළ මිලත්, එම රබර් ආනයන කිරීමට දැරිය යුතු වියදමත් සැලකූ විට නිමි රබර් භාණ්ඩ නිපදවන කර්මාන්ත කරුවනට ඔවුනට අවශ්‍ය රබර් වෙනත් රටකින් ලබා ගැනීමට විශාල මුදලකුත් ඒ වාගේම වැඩි කාලයකුත් වැය කිරීමට සිදුව ඇත. මේ අනුව බලන විට ලංකාවේ නිපදවන ස්වාභාවික රබර් වලට රට තුලම විශාල ඉල්ලුමක් පවතින බව ඉතා පැහැදිලිය. ස්වභාවික රබර් සඳහා මෙසේ පවතින ඉහළ මිලත්, ඉහළ ඉල්ලුමත් හඳුනාගත් රජය ලංකාවේ රබර් වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීමට සැලසුම් සහ ප්‍රතිපත්ති හඳුන්වා දී ඇත. මෙම ප්‍රතිපත්ති තුලින් රබර් වගාව ශ්‍රී ලංකාවේ සම්ප්‍රදානුකූලව වගා කෙරෙන ප්‍රදේශ වලින් වෙනත් ප්‍රදේශ වලටද ව්‍යාප්ත කිරීමට සැලසුම් යොදා ඇත. එම වෙනත් ප්‍රදේශ අතරින් රබර් වගාවට ඉතාමත් යෝග්‍ය පසුබිමක් ඇති මොණරාගලට විශේෂ අවධානයක් යොමු කර ඇත. ඉදිරි වසර 10 තුලදී මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් අක්කර ලක්ෂයක් වගා කිරීමට ඉලක්ක කර ඇත.

මේ සඳහා අවශ්‍ය රබර් පැළ ලබාගැනීමට රජයේ රබර් පැළ තවාන් වලට අමතරව පෞද්ගලික තවාන් හිමියන්ද සහභාගි කරගනු ලැබේ. මොණරාගල ප්‍රදේශයේ රබර් ගොවීනට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට සහ ව්‍යාප්ත කටයුතු වැඩි දියුණු කිරීම සඳහා අමතර රබර් උපදේශක මහතුන් යොදා ඇත. කුඩා ඉඩම් හිමියන් නිපදවන ස්වාභාවික රබර් තරඟකාරී මිලකට අලෙවි කිරීමට හැකි වන පරිදි රබර් නිමි භාණ්ඩ නිපදවන කර්මාන්ත කිහිපයක් මොණරාගල දිස්ත්‍රික්කය තුල ආරම්භ කිරීමට කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික රබර් සම්ප්‍රදානුකූලව වගා කෙරෙන ප්‍රදේශ වලට නිරිත හා ඊසාන දිග මෝසම් සුළං මගින් වැසි ලැබෙන අතර මොණරාගල දිස්ත්‍රික්කයට ලැබෙනුයේ ඊසාන දිග මෝසම් සුළං වලින් ලැබෙන වැසි පමණි. එම නිසා මොණරාගල රබර් වගා කිරීමේදී පොලිතීන් මලුවල සිටවන ලද ගුණාත්මක බැවින් උසස් රබර් පැළ භාවිත කිරීමත්, වර්ෂයේ නියමිත කාලයේ පැළ සිටවීමත්, වගාවේ මුල් අවදියේදී වසුන් යොදා පැළ හොඳින් රැකබලා ගැනීමත් අත්‍යාවශ්‍යය. ඊසාන දිග මෝසම් සුළං වලින් පමණක් මොණරාගල දිස්ත්‍රික්කයට වර්ෂාව ලැබීම රබර් පැළ ස්ථාපනයට හා වගාවේ මුල් අවදියේ

වර්ධනයට තරමක් අහිත කර වුවත් වගාව පරිනතවූ පසු වසරකට වැඩි දින ගණනක් කිරි කැපීමට හැකිවීම ගොවිනට යහපත් දෙයකි. ශ්‍රී ලංකාවේ බහුලව රබර් වගාකෙරෙන අනෙකුත් ප්‍රදේශ හා සැසඳීමේදී සාපේක්ෂව තැනිතලා බිමත්, පස සරුබවින් වැඩි වීමත් මොණරාගල රබර් වගාවට වඩාත් යෝග්‍ය කරවයි. මොණරාගල ප්‍රදේශයේ රබර් වගාවට පවතින සුදුසු පරිසරික සහ දේශගුණික සාධකත්, නියමිත කෘෂි පිළිවෙත් අනුගමනය කිරීම තුලිනුත් දැනට එම දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යන සමහර රබර් වගා වලින් වසරකට අක්කරයකට වියළි රබර් කිලෝ ග්‍රෑම් 1000ක පමණ ඉහළ ඵලදායිත්වයක් වාර්තා වී ඇත. ගොවි මහතකුට අක්කර දෙකහාමාරක රබර් වගා කරගතහොත් ගසක දවසක් හැර දවසක් කිරි කැපීමට ගස් කට්ටි (ගස් 250 ක්) දෙකක් ලැබෙනු ඇත. අක්කර දෙකහමාරක් නියමිත කෘෂි පිළිවෙත් අනුගමනය කර පාලනය කිරීම තුලින් වසරකට රබර් කිලෝ ග්‍රෑම් 2500 ක් පමණ ලබාගත හැක. දැනට පවතින රබර් මිළ අනුව මින් ලබාගත හැකි දල ආදායම වසරකට රුපියල් ලක්ෂ දෙක හමාරක් පමණවේ. රබර් කිරි විකිනීම තුලින් සහ ගොවි මහතුන්ම වගාවේ කටයුතු වල යෙදීම තුලින් මෙම මුළු දල ආදායමම ශුද්ධ ලාභයක් බවට පත්කර ගත හැක. රබර් වගාවක ආර්ථික වශයෙන් ඵලදායි ආයුකාලය වසර 30කි. මෙවැනි ගසක් දැව සඳහා රු. 750/- කට පමණ අලෙවි කල හැකි අතර එයින්ද ගොවියාට ලබාගත හැකි ආදායම අති විශාලය.

රබර් වගාවක් ආරම්භ කිරීමෙන් පසු කිරි කැපීමේ අවස්ථාවට එළඹීමට වසර 6ක් පමන ගතවේ. අතුරු භෝගයක් ලෙස එළවළු, බඩ ඉරිඟු සහ උක් වැනි භෝග වගා කිරීම තුලින් රබර් වගාවේ අපරිනත කාලය තුලද්ද ගොවිනට ආදායමක් ලාබගත හැක. මෙම ක්‍රමය රබර් ගස් වල වර්ධනයටද හිතකර බව අත්හදා බැලීම තුලින් පෙනි ගොස් ඇත.

වන සම්පත ක්‍රම ක්‍රමයෙන් අඩුවීගෙන යන මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත වීම තුලින් පරිසරයට ලැබෙන දායකත්තවය ඉමහත්ය. ඉහත කරුණු අනුව රබර් වගාව මොණරාගලට උචිත වගාවක් වන අතර ඒ තුලින් එම වගාකටයුතු වල නියැලී සිටින ගොවිනටද, අප රටේ පරිසරය හා ආර්ථිකයටද අති විශාල දායකත්වයක් ලැබෙන බව නොඅනුමානය.